[ප්‍රතිශෝධිත මුද්‍රණය]

(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය

**2025 මැයි 08 බ්‍රහස්පතින්දා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2025 අප්‍රේල් 10 බ්‍රහස්පතින්දා**

---

**2025 මැයි 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

133/2024

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ විභාග කරමින් පවතින අවුරුදු පහ ඉක්ම වූ සහ අවුරුදු දහය ඉක්මවූ සිවිල් නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නඩු විභාග කර අවසන් කිරීමේදී පවතින ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

153/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සුළං විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සුළං විදුලි බලාගාරයේ ධාරිතාවය (Installed Capacity) වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2022 සිට 2024 දක්වා එම එක් එක් සුළං විදුලි බලාගාරය මඟින් ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලද බලශක්ති ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාව තුළ සුළං මඟින් විදුලි බලය උත්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

156/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 නොවැම්බර් මාසයේදී එල්.ටී.ටී.ඊ. සංවිධානය, වෙනත් සංවිධානයක්, පුද්ගලයෙක් හෝ පුද්ගලයන් විසින් උතුරු-නැගෙනහිර යුද්ධයේදී මියගිය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයන් සිහි කරමින් මහ විරු සැමරුම් පවත්වා තිබේද;

(ii) එසේ නම්, ඒවා පවත්වන ලද පාර්ශ්වයන් කවරේද;

(iii) ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදී තිබේද;

(iv) එම සැමරුම් පැවැත්වීමට පෙර ඒ සම්බන්ධයෙන් රජය දැනුම්වත්වී තිබේද;

(v) ශ්‍රී ලංකාවේ පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද තහනම් කර ඇති සංවිධානයකට ශ්‍රී ලංකාව තුළ එවැනි සැමරුම් පැවැත්වීමේ හැකියාවක් තිබේද;

(vi) එම සැමරුම් පැවැත්වීම නැවැත්වීම සඳහා ගන්නා ලද පියවර කවරේද;

(vii) තහනම් සංවිධානයක සැමරුම් පැවැත්වීම සම්බන්ධයෙන් රජය වගකීම් භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

192/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයට හා ඒ යටතේ ඇති ආයතනවලට ලැබුණු මූල්‍ය ආධාර හා මූල්‍ය නොවන ආධාර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික විගණන කාර්යාලයේ වාර්තාවට අනුව ඒවා නිවැරදි ලෙස ගිණුම්ගත කර නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

259/2024

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා කාලය තුළ දී හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය කරන ලද රට, අරමුණ, ශ්‍රී ලංකාවට හිමි වූ ප්‍රතිලාභ, හිටපු ජනාධිපතිවරයාට අමතරව රජයේ වියදමින් සම්බන්ධ වූ පුද්ගලයන් සහ ඔවුන් සම්බන්ධ කර ගැනීමේ අරමුණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදේශ සංචාර සඳහා වැය කරන ලද සම්පූර්ණ වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

306/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 20 තුළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් (SLR) හා ඇමරිකානු ඩොලර්වලින් (USD) සහ එම කාලය තුළ වර්ධන වේගය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි වසර 5 සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ අපේක්ෂිත වර්ධනය සහ වර්ධන අනුපාතයේ ප්‍රක්ෂේපණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර 20 තුළ අපනයනවල මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල් හා ඇමරිකානු ඩොලර් වලින් සහ එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඉහළම අපනයන වෙළඳ භාණ්ඩ විස්ස කවරේද;

(v) පසුගිය වසර 10 තුළ සේවාවලින් ලැබුණු මුළු ආදායම ඇමරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකාවට වැඩිම ඇමරිකානු ඩොලර් ප්‍රමාණයක් උපයා දෙන ලද සේවා අංශ දහය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උපයන ලද ඇමරිකානු ඩොලර්වලින් කොපමණ ප්‍රමාණයක් විදේශයන්හි රඳවා තිබේද;

(ii) ඇමරිකානු ඩොලර් විදේශයන්හි රඳවා තැබිය හැකි නිල කාලය කොපමණද;

(iii) විනිමය පාලන නියමයන් උල්ලංඝනය කරමින් විදේශයන්හි මුදල් රඳවා තබා ගන්නා පුද්ගලයින්ට හෝ ආයතනවලට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

335/2024

ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුපොත, ‘කුරක්කන්හේනේගෙදර පානීය ජල ව්‍යාපෘතිය’ නමින් ප්‍රජා ජල ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබූ බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු සඳහා වියදම් කරනු ලැබූ මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) එම ප්‍රදේශයේ ඇති රෝහල සහ කුරක්කන්හේනේගෙදර, සපුමල්පුරය, දංගොල්ල හා කටුපොත යන ප්‍රදේශවල පවුල් ඒකක 700කට අධික සංඛ්‍යාවකට අයත් ජනතාව ආවරණය වන පරිදි එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බව දන්නේද;

(v) මේ වනවිට එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නතරවීමට හේතු කවරේද;

(vi) එම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කර ඉහත සඳහන් ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට පියවර ගන්නේද;

(vii) එසේ නම්, එය ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

560/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන යුද හමුදාපති සහ ගුවන් හමුදාපති පත්කරන ලද ක්‍රමවේදය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) යුද හමුදාපති තනතුර සහ ගුවන් හමුදාපති තනතුර සඳහා පත් කිරීමට වර්තමාන යුද හමුදාපතිවරයාට සහ ගුවන් හමුදාපතිවරයාට වඩා ජ්‍යෙෂ්ඨ සහ සුදුසුකම් සහිත නිලධාරීන් නොසිටියේද;

(iii) ජ්‍යෙෂ්ඨ සහ සුදුසුකම් සහිත වෙනත් නිලධාරීන් සිටියේ නම්, එම නිලධාරීන් නොසලකා හැර වර්තමාන යුද හමුදාපති සහ ගුවන් හමුදාපති පත් කිරීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) හමුදාපතිවරුන් පත් කිරීමේදී, ජ්‍යෙෂ්ඨත්වය හැර සලකා බලනු ලබන වෙනත් නිර්ණායක තිබේද;

(v) එසේ නම්, එම නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

617/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල බාහිර රෝගී අංශවලින් ප්‍රතිකාර ලබා ගත් රෝගීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ රජයේ රෝහල්වල බාහිර රෝගී ප්‍රතිකාර අංශ සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශක ඉහළ අගයක් ගැනීමට බාහිර රෝගී ප්‍රතිකාර අංශ විශාල දායකත්වයක් ලබා දෙන බව පිළිගන්නේද;

(iv) එම අංශය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

873/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය පැවති දින දක්වා මුද්‍රණය කරන ලද මුදල්වල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(ii) ඉහත කාල සීමාව තුළ එක් එක් මුදල් අමාත්‍යවරයා යටතේ මුද්‍රණය කරන ලද මුදල්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(iii) ඉහත කාල සීමාව තුළ එක් එක් ජනාධිපතිවරයා යටතේ මුද්‍රණය කරන ලද මුදල්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළට අයත් වන යම් කාල වකවානුවක පාලනයකින් තොරව මුදල් මුද්‍රණය කර තිබේද;

(v) පාලනයකින් තොරව මුදල් මුද්‍රණය කිරීමේ අහිතකර බලපෑම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය,— රේගු ආඥා පනතේ (235 අධිකාරය වූ) "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2025.04.09 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 ජනවාරි 27 දිනැති අංක 2421/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2025 මැයි 09 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

277/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බාලිකා ජාතික පාසලක් ඇති අතර, එම කොට්ඨාසයේ පිරිමි ජාතික පාසලක් පිහිටුවීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ජාතික පාසලක් බවට පත් කිරීම සඳහා ඉහත කොට්ඨාසයෙන් හඳුනාගන්නා ලද පාසල කවරේද;

(iii) එම පාසල සඳහා ලබා දීමට නියමිත පහසුකම් කවරේද;

(iv) එම ජාතික පාසල පිහිටුවනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

430/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුර සහ නැගෙනහිර පළාත්වල ඇති ජාතික මට්ටමේ ක්‍රීඩාංගන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ක්‍රීඩාංගනය පිහිටුවා ඇති ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති මැකේසර් ක්‍රීඩාංගනය (Mc Heyzer Stadium) ජාතික මට්ටමේ ක්‍රීඩාංගනයක් බවට පත් කිරීම සඳහා කටයුතු කරනු ලැබූ අතර ඊට අදාළ කැණීම් සිදු කිරීමේදී මිනිස් අස්ථි කොටස් හමු වීම හේතුවෙන් එම කැණීම් අත්හිටවූ බව දන්නේද?

(iv) අත්හිටුවා තිබූ එම කැණීම් නැවත ආරම්භ කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) මැකේසර් ක්‍රීඩාංගනය ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයක් බවට පත්කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

432/2025

ගරු අජිත් ගිහාන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නීත්‍යානුකූල බලපත්‍ර මත සිදු කරනු ලබන වැලි, බොරලු, පස් සහ වැව් කැනීම් ප්‍රමිතියෙන් තොරව සිදු කිරීම හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල පරිසර විනාශයක් සිදු වන බව දන්නේද;

(ii) එම කැනීම් නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iii) වැලි, බොරලු, පස් සහ වැව් කැනීම සඳහා සහ ඒවාට ප්‍රවාහන බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් නව ක්‍රමවේදයක් හඳුන්වාදී තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වයඹ පළාතේ විශාල පරිසර විනාශයක් සිදු කරමින් පවතින තත්ත්වයක් තුළ වයඹ පළාත් පරිසර අධිකාරියේ මැදිහත්වීම කවරේද;

(ii) එම අධිකාරියේ වගකීම කවරේද;

(iii) වයඹ පළාත් පරිසර අධිකාරිය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

452/2025

ගරු ටී. කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගිං ගඟ පිටාර ගැලීම හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවිතවලට හා දේපලවලට විශාල බලපෑමක් ඇති කරන බව පිළිගන්නේද;

(ii) 2000 වර්ෂයෙන් පසු ගිං ගඟේ පිටාර ගැලීම පාලනය කිරීම සඳහා හෝ වෙනත් අරමුණක් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්තා සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වාර්තා කවරේද;

(iv) එම වාර්තා සකස් කරන ලද ආයතන කවරේද;

(v) එම ව්‍යාපෘති වාර්තා/ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(vi) ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගත් ප්‍රභවයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගිං ගඟේ පිටාර ගැලීම පාලනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය, අවසන් කරන ලද වර්ෂය, වෙන් කරන ලද මුදල, වියදම් කරන ලද මුදල, ක්‍රියාත්මක කරන ලද ආයතනය සහ ලැබී ඇති විසඳුම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

455/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රයිගම්පුර කර්මාන්තපුරයේ කර්මාන්තකරුවන් සඳහා ඉඩම් ලබා දී තිබේද;

(ii) එසේ නම්, මේ වන විට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ලබා දී ඇති ඉඩම් අතරින් මේ වනවිට වැඩ ආරම්භ කර ඇති ඉඩම් ප්‍රමාණය සහ වැඩ ආරම්භ කර නොමැති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ දක්වා වැඩ ආරම්භ කර නොමැති ඉඩම්වල වැඩ ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(v) මේ දක්වා වැඩ ආරම්භ කර නොමැති ඉඩම් ලබා ගෙන ඇති ආයෝජකයන් විසින් ආයෝජනය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කර්මාන්තපුරයේ ඉදිකර ඇති පරිපාලන ගොඩනැගිල්ලේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රජයෙන් වියදම් කරන ලද මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

493/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලවලින් උපාධිය හදාරා අවසන් කර ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට දේශීය ආයුර්වේද රෝහල්වල ආයුර්වේද වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මින්නේරිය ආයුර්වේද රෝහලේ භෞත චිකිත්සක ඒකකයක් පවතින බව දන්නේද;

(ii) එම ඒකකය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සිදු කරනු ලැබුවේ කවුරුන්ද;

(iii) එම කොන්ත්‍රාත්තුවේ වංචාවක් සිදු වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරනු ලැබුවේද;

(v) එම විමර්ශනයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

575/2025

ගරු චානක මාදුගොඩ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උප තැපැල් කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා උප තැපැල් ස්ථානාධිපතිවරුන්ට මේ වනවිට ගෙවනු ලබන කාර්යාල කුලී දීමනාව ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) එම කුලී දීමනාව වැඩි කිරීම සඳහා ඇති බාධා හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඒවා මඟහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

781/2025

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සංචාරක අමාත්‍යාංශය විසින් මහියංගනය නගරයේ සංචාරක සුව පහසු මධ්‍යස්ථානයක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම පරිශ්‍රයේ විශාලත්වය වර්ග අඩි කොපමණද;

(iii) එය ඉදිකිරීම සඳහා වියදම් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) එම මධ්‍යස්ථානය ඉදිකිරීමේ අරමුණ කවරේද;

(v) එම අරමුණ ඉටු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල බදුදී තිබේද;

(ii) එසේ නම්, බදු ගැනුම්කරුගේ නම කවරේද;

(iii) මාසික බදු කුලිය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

800/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිනපතා උදෑසන කුරුණෑගල සිට විශාල ජනතාවක් රාජකාරි සඳහා කොළඹට පැමිණෙන අතර ඔවුන් මහව සිට ධාවනය ආරම්භ කර කුරුණෑගලින් පෙ.ව. 5.45ට පිටත්වන දුම්රිය ඒ සඳහා භාවිතා කරන බවත්;

(ii) ඉහත දුම්රිය කුරුණෑගලට ළඟා වනවිට මඟීන්ගෙන් පිරී ඉතිරී යන බවත්;

(iii) මීට විසඳුම ලෙස කුරුණෑගලින් පෙ.ව. 6.00ට දුම්රියක් ආරම්භ කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පෙ.ව. 6.30ට පොල්ගහවෙලින් ගමන් ආරම්භ කර මොරටුව දක්වා ධාවනය කරනු ලබන දුම්රිය, කුරුණෑගලින් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග තිබේද;

(iii) එසේ නම්, එම විකල්ප ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

847/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් එම කොමිෂන් සභාවේ සේවකයන් වෙත විශේෂ වරප්‍රසාද යටතේ ඉඩම් බැහැර කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එලෙස ඉඩම් ලබාදී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඊට අදාළ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන් වෙත විශේෂ වරප්‍රසාද යටතේ ඉඩම් බැහැර කිරීමේ නෛතික පදනම කවරේද;

(v) එලෙස බැහැර කරන ලද ඉඩම්, වෙනත් පාර්ශ්ව වෙත විකිණීමට හෝ පැවරීමට හැකියාවක් තිබේද;

(vi) විශේෂ වරප්‍රසාද යටතේ ලැබුණු ඉඩම් අතරින් වෙනත් පාර්ශ්ව වෙත විකුණා හෝ පවරා ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද;

(vii) එම ඉඩම්, වෙනත් පාර්ශ්ව වෙත විකිණීම හෝ පැවරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

පා. 2/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද සුදුසු පරිදි කප්පාදු කිරීම,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද පිළිබඳව මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන් හි මෙන්ම මෙරට ජන සමාජය තුළ කතිකාවක් ඇති වී තිබෙන හෙයින්, රටේ පොදු ජනතාවගේ ඉල්ලීමට සවන්දෙමින් ඔවුන්ගේ අපේක්ෂාවන් සඵල කිරීම පිණිස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට, හිටපු රාජ්‍ය නායකයන්ට හා එම වැන්දඹුවන්ට විරාත් කාලයක් ලබා දී තිබූ වරප්‍රසාද සුදුසු පරිදි අඩු කිරීම, ඉවත් කිරීම හෝ ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරයන්ගෙන් සාධාරණ පිළිතුරක් පාර්ලිමේන්තු සභාව තුළ දී සාකච්ඡා කොට ලබා ගැනීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා. 7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

8.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා. 12/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සහ බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා වෙනත් ද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලිය පුද්ගලයන් කිහිපදෙනෙකු අත රඳා පැවතීම නිසා ජනතාවට විවිධ අසීරුතාවයන්ට මුහුණදීමට සිදුවී තිබෙන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා. 14/2024

ගරු රෝහණ බංඩාර මහතා,— සමුපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය නිසි අධීක්ෂණයකට ලක් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට ඉතාම සමීප සමුපකාර ග්‍රාමීය බැංකු රැසක් පසුගිය කාලයේ දී විවිධ හේතු මත බිඳ වැටීමෙන් එහි තැන්පත්කරුවන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටින හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා එම බැංකු රජය විසින් නිසි අධීක්ෂණයකට ලක් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා. 19/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— විගණන වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— රජයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සිදුවන විවිධ මූල්‍යමය වංචා පිළිබඳව විගණන වාර්තා මඟින් කරුණු හෙළි කරන හෙයින්, එවැනි වංචා හා දූෂණ රාජ්‍ය ආයතනවල සිදුවීම වැළැක්වීම සඳහා එම වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සහා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

19.

පා. 23/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීම,— ශ්‍රී ලංකාවේ ජාතික නිෂ්පාදනයට පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

20.

පා. 25/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත්වීමට නිවසක් ලබා දීම,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත් වීමට නිවසක් හිමි විය යුතු වන බැවින්, සෑම ගෘහමූලිකයෙකු හටම තම ආරක්ෂාව සහ යහ පැවැත්ම උදෙසා නිවසක් මිලදී ගැනීම, ඉදිකිරීම හෝ කුලියට ගැනීම සඳහා සවිබල ගන්වමින් ඔහු හෝ ඇය හට පහසුකම් සැලැස්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

21.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

22.

පා. 27/2024

ගරු රවී කරුණානායක මහතා,— සෑම තරුණයෙකුම ඵලදායි රැකියාවක නියුතු පුද්ගලයෙකු හෝ ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත් කිරීම,— වයස අවුරුදු 18 සම්පූර්ණ කරන සෑම තරුණයෙකුටම ඵලදායි රැකියාවක නියැලීමේ අයිතිය තිබිය යුතු අතර, රැකියාවක නිරත නොවන්නේ නම්, ස්වයං රැකියාවක නියුතු ව්‍යවසායකයෙකු බවට පත්වීම සඳහා මූල්‍ය ආධාර ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

23.

පා. 30/2025

ගරු රවී කරුණානායක මහතා,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කළ යුතු බවටත් ශ්‍රී ලංකාවේ දැනට උද්ගතව තිබෙන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාර්ගික හෝ ආගමික පදනමක් දක්වන නම් දරන දැනට පවතින දේශපාලන පක්ෂ වලටද එවැනි වෙනසක් ක්‍රියාත්මක කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

24.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

25.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

26.

පා. 33/2025

ගරු රවී කරුණානායක මහතා,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන ගැටළු විසඳීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන පහරදීම, පැහැර ගැනීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අපයෝජනය, මනුෂ්‍ය ඝාතනය හා මූල්‍ය වංචා ඇතුළු ගැටළු පිළිබඳව සොයා බැලීමට සහ බලපෑමට ලක් වූ සේවකයින්හට ශ්‍රී ලංකාවට ආරක්ෂිතව නැවත පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමට නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

27.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

28.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

29.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

30.

පා. 37/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— පොදු ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූල බස් රථ පමණක් මෙරටට ගෙන්වීමට අදාළ නීති සකස් කිරීම,— ලංකා ගමනාගමන මණ්ඩලයේ මෙන්ම පෞද්ගලික අංශයේ බස් රථ මගී ප්‍රවාහනය සඳහා සුදුසු තත්ත්වයක නොපවතින හෙයින්ද, එම බස් රථවලින් අති බහුතරයක් ලොරි චැසි මත ඉදිකරන ලද ඒවා වන හෙයින්ද, අනාගතයේදී රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට බස් රථ ගෙන්වීමේදී මගී ප්‍රවාහනය සඳහා නිෂ්පාදිත, මගී සුවපහසුවට ගැලපෙන සහ පොදු ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූල බස් රථ පමණක් ශ්‍රී ලංකාවට ගෙන්වීමට අදාළ නීති රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

31.

පා. 38/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— "සංවර්ධන යෝජනා" නමින් ශ්‍රී ලංකාව තුළ මේ දක්වා ඉදිකර ඇති එහෙත් කිසිදු ප්‍රයෝජනයකට නොගන්නා ලද සියලුම ගොඩනැගිලි මහජන ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට කටයුතු කිරීම,— විදේශ ආධාර හෝ විදේශ ණය මත හෝ මධ්‍යම රජයේ හෝ පළාත් පාලන ආයතනවල මුදල් වියදම් කොට "සංවර්ධන යෝජනා" නමින් රට පුරා ගොඩනැගිලි ඉදිකර ඇති හෙයින් මේ දක්වා ඉදිකොට ඇති, එහෙත් කිසිදු ප්‍රයෝජනයකට නොගන්නා එවැනි ගොඩනැගිලි මහජන ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයකට ගොඩනැංවීමට රජය විසින් සුදුසු තීරණ ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

32.

පා. 39/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇති ජනතා අප්‍රසාදය වළක්වා ගැනීමට කටයුතු කිරීම,— ජනතාවට වඩාත්ම සමීපතම මහජන නියෝජිත ආයතනවන බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් බොහෝවිට ජනතාව තුළ ඉතාමත් අසතුටුදායක හැඟීමක් පවතින හෙයින් එම ආයතන පිළිබඳ වැඩි අවධානයක් ලබා දීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

33.

පා. 40/2025

ගරු ටී. කේ. ජයසුන්දර මහතා,— පිටිගල, උඩුගම, නෙලුව සහ දෙණියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— ශ්‍රී ලංකාව නව පුනරුදයකට අවතීර්ණ වී ඇති අවස්ථාවක රටේ සංචාරක ව්‍යාපාරය දේශීය ආදායම ඉහළ නැංවීමට හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පහතරට වැසි වනාන්තර අතරින් ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයද, විශේෂිත සත්ත්ව හා ශාක විශේෂවලින් ගහන වූ කන්නෙලිය වනාන්තරය සහ හිනිදුම කන්ද ඇතුළත් කඳුවැටියේ (හේකොක්) ජෛව පද්ධතිය විදේශීය ජනතාවගේ විශේෂ අවධානය දිනාගත් පරිසර පද්ධතියක් වන හෙයින්ද, මෙම පරිසර පද්ධතිය ඇතුළත් පිටිගල, උඩුගම, නෙලුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කර එය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

34.

පා. 41/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

35.

පා. 42/2025

ගරු රුවන් මාපලගම මහතා,— පාසැල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්මය ඇතුළත් කිරීම,— මෙරට පොදු ජනතාව මුහුණ දෙන එදිනෙදා ගැටලුවලට ප්‍රධාන හේතුවක් ලෙස එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික නීතිය පිළිබඳ නොදැනුවත්කම හඳුනාගෙන ඇති හෙයින් ද, නීතිය නොදැන සිටීම නීතිය ඉදිරියේදී නිදහසට කරුණක් නොවන හෙයින්ද, පාසැල් විෂය මාලාව සංකීර්ණ වීම වළක්වා ගනිමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසැල් දරුවන්ගේ පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශයට රටේ මූලික නීතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

36.

පා. 43/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මහාචාර්ය, ආචාර්ය තනතුරු අවභාවිත කිරීම වළක්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ අප සමාජයේ බොහෝ පිරිස් මහාචාර්ය, ආචාර්ය වැනි තනතුරු හා නාමයන් අවභාවිත කරන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වැඩසටහනක් සකස් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

37.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

38.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

39.

පා. 46/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරික්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරික්ෂණාගාරය පිහිටුවා මේ වන විට වසර 35ක් පමණ ගතවී ඇති හෙයින්ද, එම පරික්ෂණාගාරය මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින්ද, එබැවින් ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරික්ෂාවකට ලක් නොවන හෙයින්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා නිසි වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

40.

පා. 47/2025

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම,— රටක ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම රජයක වගකීම වන හෙයින්, මෙරට ජනයාගෙන් බහුතරයක් වන ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

41.

පා. 48/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීම,— විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළ යුතු වුවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වසර 21කට වැඩි කාලයක සිට ඛනිජ තෙල් සහ ජලය යන කර්මාන්ත නියාමනයට යටත් නොවී තිබෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා අදාල නීතිමය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

42.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

43.

පා. 50/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය වැළැක්වීමට ක්‍රමවේදයක් සකස් කිරීම,— විශේෂයෙන්ම ඌව පළාත ඇතුළුව කඳුකර ප්‍රදේශවල වගා කර ඇති ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය පිළිබඳව සලකා බලා ඒවා ඉවත් කර ප්‍රයෝජනවත් දේශීය වගාවන් සිදු කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

**2025 මැයි 20 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

496/2025

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ විකාශය වන ලාංකීය රූපවාහිනී නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, රජයේ රූපවාහිනී නාලිකා හා පෞද්ගලික රූපවාහිනී නාලිකා ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ හා පෞද්ගලික රූපවාහිනී නාලිකා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජනමාධ්‍ය සඳහා ආචාර ධර්ම පද්ධතියක් පැවතිය යුතු බව පිළිගන්නේද;

(ii) එම ආචාර ධර්ම පද්ධතිය, ශ්‍රී ලාංකීය රූපවාහිනී නාලිකා සම්බන්ධයෙන් බලපැවැත්වෙන ආකාරය කෙසේද;

(iii) රූපවාහිනී නාලිකාවල මේ වනවිට විකාශය කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති ආකාරය කෙසේද;

(iv) එම වැඩසටහන් සම්බන්ධයෙන් විමර්ශනාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

500/2025

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති අධිකරණවල නීති කෘත්‍යයේ යෙදී සිටින නවක නීතිඥවරුන් සඳහා කාර්යාල නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, මේ දක්වා කාර්යාල නොමැති නීතිඥවරුන් සංඛ්‍යාව මහනුවර දිස්ත්‍රික්කයේ එක් එක් අධිකරණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මහනුවර, ගැටඹේ පිහිටුවා ඇති නීතිඥ කාර්යාල සංකීර්ණයට යාබද ඉඩමේ නව නීතිඥ කාර්යාලයක් ඉදිකිරීම සඳහා කටයුතු කර ඇති බව දන්නේද;

(iv) එම ඉදිකිරීම් කටයුතු මේ වනවිට අතරමඟ නවතා දමා ඇති බව දන්නේද;

(v) එම නව නීතිඥ කාර්යාලය ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

516/2025

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ජනාධිපතිවරයා පත්වීමෙන් පසුව අපරාධ හතකට අදාළව නවතා දමා තිබූ විමර්ශන නැවත ආරම්භ කරන ලද බව ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරන ලද බව දන්නේද;

(ii) 2011 වර්ෂයේදී යාපනය ප්‍රදේශයේදී අතුරුදහන් කිරීමට ලක් වූ 'ලලිත් වීරරාජ් සහ කුගන් මුරුගානන්දන්' යන දේශපාලන ක්‍රියාකාරීන් දෙදෙනාගේ අතුරුදහන් කිරීමට අදාළ විමර්ශනයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පැවති සිවිල් යුදමය තත්ත්වය අවසන් වීමෙන් පසු සිදු වූ, එහෙත් මේ වනතෙක් විසඳා නොමැති අනෙකුත් අතුරුදහන් කිරීම් කිසිවකට හෝ අදාළ විමර්ශන කටයුතු මේ වනවිට අවසන් කර තිබේද;

(iv) එම අතුරුදහන් කිරීම්වලට අදාළ විමර්ශන කටයුතු ප්‍රමාද වීමට දේශපාලන මැදිහත්වීම් හේතු වී තිබේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

519/2025

ගරු ජේ. සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.12.31 දිනට පෙර විශ්‍රාම ලැබූ රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සහ 2015.12.31 දිනට පසු විශ්‍රාම ලැබූ රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප අතර බරපතල විෂමතාවයක් පවතින බව දන්නේද;

(ii) එම විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) මේ වනවිට සේවය කරනු ලබන රජයේ සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව රු. 17,800/=ක් ද, රජයේ විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව රු. 9,025/=ක් ද වන අතර, ඒ අනුව රු. 8,775/=ක විෂමතාවයක් පවතින බව දන්නේද;

(iv) එම විෂමතාවය ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

542/2025

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව ගුවන් ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා දිනකට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) නව ගුවන් ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා මේ වනවිට ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) දිනකට නිකුත් කරනු ලබන නව ගුවන් ගමන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) නව ගුවන් ගමන් බලපත්‍ර ලබා ගැනීමට සහ පවතින ගුවන් ගමන් බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කර ගැනීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත අයදුම් කළ පසු ඒ සඳහා දීර්ඝ කාලයක් ගතවන බව දන්නේද;

(v) එම ගැටලුව විසඳීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

571/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජයන් විසින් පානීය ජල යෝජනා ක්‍රම ආරම්භ නොකිරීම හේතුවෙන් වතුකරයේ ජනතාවට පිරිසිදු පානීය ජලය නොලැබීමෙන් ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත් වී සිටින බවත්;

(ii) 1987 වර්ෂයේදී යුනිසෙෆ් ආයතනය විසින් වතු පානීය ජල යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යුනිසෙෆ් ආයතනය විසින් ආරම්භ කරන ලද වතු පානීය ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ආරම්භ කරන ලද දිස්ත්‍රික්ක සහ වතු කවරේද;

(iii) ඒවා මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(iv) එම එක් එක් යෝජනා ක්‍රමයේ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහ (05) තුළ බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද පානීය ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූනාගල, එල්.එල්.ජී. කැප්කඩේ නව නිවාස යෝජනා ක්‍රමයට අදාළ පානීය ජල යෝජනා ක්‍රමය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) එම පානීය ජල යෝජනා ක්‍රමයේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

573/2025

ගරු අතුල වෙලඳගොඩ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාල ජාතික වනෝද්‍යානයේ සේවක හිඟය, සේවකයන්ගේ නිවාස, සංචාරක බංගලා, වැසිකිලි පහසුකම්, මාර්ග පද්ධතිය සහ පොදු පහසුකම් පිළිබඳව පැන නැඟී ඇති ගැටලු සම්බන්ධයෙන් දැනුම්වත් වී තිබේද;

(ii) එම වනෝද්‍යානයට ඇතුළුවීමට අවසර ඇති ලියාපදිංචි සංචාරක ජීප්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) ලියාපදිංචි වී ඇති එහෙත් මේ වනවිට සංචාරක පහසුකම් ලබා නොදෙන ජීප්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) එම ජීප්රථ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ජීප්රථ වෙනුවට ආදේශක ජීප්රථ ලියාපදිංචි කර ගැනීමට පියවර ගන්නේද;

(vi) ඉහළ සංචාරක ආකර්ශණයක් හා අවධානයක් දිනා ගෙන ඇති, ශ්‍රී ලංකාවට විශාල ආදායමක් දෛනිකව ලබා දෙන යාල ජාතික වනෝද්‍යානයේ සිටින වනසතුන් හා පරිසර පද්ධතිය රැකගැනීමට සහ සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

578/2025

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඇති කලපුව හේතුවෙන් එම දිස්ත්‍රික්කය එළුවාන්කරෙයි හා පඩුවාන්කරෙයි යනුවෙන් භූමි භාග දෙකකට වෙන් වී ඇති බැවින් එහි ජීවත් වන ජනතාවගේ ප්‍රවාහන හා ආර්ථික කටයුතුවලට දැඩි අහිතකර බලපෑමක් එල්ල වී ඇති බවත්;

(ii) එම ජනතාව මුහුණ දෙන ප්‍රවාහන ගැටලු විසඳීම සඳහා පාලම් තැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රමාණවත් පරිදි පාලම් නොමැති වීම හේතුවෙන් එම දිස්ත්‍රික්කයේ ජනතාව මුහුණ පා සිටින දුෂ්කරතා කවරේද;

(ii) එම දුෂ්කරතා මඟහැරවීම සඳහා ඉදිකළ යුතු පාලම් සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(iii) එම පාලම් ඉදි කළ යුතු ප්‍රදේශ කවරේද;

(iv) ඉදිකිරීමට නියමිත පාලම් අතරින් 2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදනවලින් සහ ජාත්‍යන්තර ආධාරවලින් අවම වශයෙන් පාලම් දෙකක් හෝ ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(v) එම පාලම් ඉදිකිරීමෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ ජනතාවට සමාජ හා ආර්ථික වශයෙන් ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

790/2025

ගරු සුජීව දිසානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපහුව රාජධානියේ, දැඳුරු ඔය අසබඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පිහිටා ඇති බව දන්නේද;

(ii) එම ඉඩම්වල ඉදිකර තිබූ මේ වනවිට ගරා වැටෙමින් පවතින නිවාඩු නිකේතන ප්‍රතිසංස්කරණය කිරීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(iii) එම ප්‍රදේශය දේශීය සංචාරකයන්ගේ ගිමන් හරින ප්‍රදේශයක් ලෙස භාවිතා කරන අතර එහි කිසිදු සනීපාරක්ෂක පහසුකමක් නොමැති බැවින් අදාළ පහසුකම් සැපයීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වැඩපිළිවෙළක් තිබේද;

(iv) රිදීබැඳි ඇල්ල ඇනිකට් එක ප්‍රදේශයත්, එම නිවාඩු නිකේතනත් දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගැනීමට හැකි වන පරිදි වැඩිදියුණු කිරීමට සැලසුමක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට තිබේද;

(v) ඉහත ප්‍රදේශයේ අවිධිමත් ඉදිකිරීම් කිහිපයක් පැවතීම හේතුවෙන් වාරි ජලය බැස නොයෑමෙන් කෘෂිකාර්මික කටයුතුවලට බාධා එල්ල වී ඇති බැවින් එම බාධා මඟහරවා ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

835/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහා වාරිමාර්ග ජලාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජලාශවල රක්ෂිත සීමා හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, රක්ෂිත සීමා හඳුනාගෙන ඇති ජලාශ සංඛ්‍යාව කොපමණද;

(iv) රක්ෂිත සීමා හඳුනාගෙන ඇති ජලාශවල රක්ෂිත සීමාව ගැසට් කර තිබේද,

(v) රක්ෂිත සීමාව ගැසට් කර ඇති ජලාශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවර වැව ජලාශයේ රක්ෂිත සීමාව තුළ ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නාම ලේඛනයක් සභාගත කරන්නේද;

(iii) ඔවුන් ජීවත් වන ඉඩම් සඳහා බලපත්‍ර ලබා දී තිබේද;

(iv) එසේ නම්, බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මැයි 21 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

580/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කුරුණෑගල-දඹුල්ල හරහා හබරණ දක්වා දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට සැලසුම් සකස් කර ඊට අදාළ මූලික කටයුතු ආරම්භ කළ බවත්;

(ii) ඒ සඳහා ගලේවෙල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවගේ, රංගිරි දඹුල්ල රජමහා විහාරස්ථානයේ සහ බම්බාව රජමහා විහාරස්ථානයේ ඉඩම් හා දේපළවල භුක්තිය/සන්තකය අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් භුක්තිය භාරගත් එම ඉඩම් හා දේපළවල භුක්තිය මුල් හිමිකරුවන්ට නැවත භාරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දේපළ පසුගිය වර්ෂ 10කට ආසන්න කාලයක් නඩත්තු නොකිරීම හේතුවෙන් ඒවාට සිදු වී ඇති අලාභ හානි වෙනුවෙන් සහ ඉඩම් සංවර්ධනය නොකිරීම නිසා ආදායම් අහිමි වීම වෙනුවෙන් වන්දි මුදලක්/කරුණා සහගත දීමනාවක් ගෙවන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

(iv) එම වන්දි/කරුණා සහගත දීමනාව ලබා දෙන දිනය කවරේද;

(v) නොඑසේ නම්, එවැනි යම් ගෙවීමක් සිදු නොකරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

582/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංවර්ධන කටයුතු සඳහා මධ්‍යම ආණ්ඩුව විසින් පළාත් සභා වෙත මුදල් වෙන් කරන්නේද;

(ii) මධ්‍යම ආණ්ඩුව විසින් පළාත් සභා වෙත වෙන් කරනු ලබන මුදල් වියදම් කරනු ලබන ආකාරය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුම්වත්වන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැවති අවසන් දකුණු පළාත් සභාව වෙත වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදලෙන් දකුණු පළාත් සංස්කෘතික අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) දකුණු පළාත් සංස්කෘතික අමාත්‍යාංශය විසින් ඉදිකිරීම් ආරම්භ කර මේ වනවිට ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා ඇති ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(v) ඉහත ගොඩනැගිලි ජනතා අවශ්‍යතාවයන් වෙනුවෙන් යොදා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

604/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ, පන්සිල්ගොඩ ප්‍රදේශයේ පිහිටි ගම්මාන 09ක 8000ක් පමණ ජනතාව දෛනිකව භාවිතා කරනු ලබන පාලම අලුත්වැඩියා කිරීම සඳහා 2021 වර්ෂයේදී ගලවා ඉවත් කර ඇති බවත්;

(ii) එහෙත්, වර්ෂ 04ක කාලයක් පුරා එම පාලමේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීම හා එම මාර්ගයේ ගම්පහ දක්වා ධාවනය වූ බස්රථ දෙක ධාවනය නොකිරීම හේතුවෙන් ඉහත ජනතාව දුෂ්කරතාවයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) එම සම්පූර්ණ මුදලම අදාළ ගිණුමට බැර කර තිබේද;

(iii) එසේ නම්, එම ගිණුමේ නම සහ ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකුව කවරේද;

(iv) එම පාලමේ ඉදිකිරීම් මාස දෙක හමාරක් තුළ අවසන් කරන ලෙස එම පාලමේ ඉදිකිරීම් බලධාරිත්වය දරන රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට 2024.04.04 දින පැවති මිනුවන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී දැනුම් දුන් බව දන්නේද;

(v) එම පාලම විවෘත කිරීමට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

611/2025

ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ සිට මේ දක්වා ශල්‍යකර්ම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා කොළඹ, රිජ්වේ ආර්යා ළමා රෝහලට පරිත්‍යාගශීලීන්ගෙන් ලැබුණු මුදල කොපමණද;

(ii) එම මුදලෙන් භාවිතා කරන ලද මුදල සහ භාවිතා නොකරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහලට පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන මුදල් නිසි ලෙස භාවිතයට ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

631/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිංහල මාධ්‍ය සහ දමිළ මාධ්‍ය රජයේ පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සහ 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බස්නාහිර පළාතේ සිංහල මාධ්‍ය සහ දමිළ මාධ්‍ය රජයේ පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සහ 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොළඹ අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍ය සහ දමිළ මාධ්‍ය රජයේ පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සහ 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

634/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඊශ්‍රායලයේ කෘෂිකාර්මික අංශයේ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) මෙම රැකියා ලබාදීම විනිවිදභාවයෙන් යුතුව සිදුකිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

648/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉදිකිරීමට අදාළ මුල් සැලසුම සකස් කරන ලද දිනය කවරේද;

(ii) ඒ සඳහා නව මාර්ග සැලසුමක් සකස් කරන ලද දිනය කවරේද;

(iii) එම නව මාර්ග සැලසුම අත්තනෝමතික ආකාරයෙන් සකස් කර තිබෙන බවට එහි වෘත්තීය සමිති විසින් පෙන්වා දී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

666/2025

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ, වැලිසර ඇති ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් ගබඩා කිහිපයක් වෙනත් ආයතනවලට බදු දී ඇති බව දන්නේද;

(iii) ඒවා බදු පදනම මත ලබා ගෙන ඇති ආයතන කවරේද;

(iv) බදු දෙන ලද ගබඩා වෙනුවෙන් අය කරනු ලබන මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත ගබඩා පවතින වෙළඳ වටිනාකමට වඩා ඉතා අඩු මුදලකට කුලියට හෝ බදු පදනම මත ලබා දී තිබේ නම්, එම ගබඩා නැවත අත්පත් කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

667/2025

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය සත්‍යමූර්ති තංගමුත්තු මහතා යාපනය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වශයෙන් End Post තනතුරක් දරන බව එතුමා දන්නේද;

(ii) වෛද්‍ය තංගමුත්තු මහතා එම තනතුරට පත් කරන ලද දිනය කවදාද;

(iii) වෛද්‍ය තංගමුත්තු මහතා පසුගිය රජය විසින් මෙම තනතුරට පත් කරන ලද්දේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව බව එතුමා දන්නේද;

(iv) පසුගිය රජය විසින් මෙම පත් කිරීම අනුමත කරන ලද්දේ කුමන පදනම මතද;

(v) උපදේශක වෛද්‍යවරයකු End Post තනතුරකට පත් කිරීමට අමාත්‍ය මණ්ඩලයට අධිකාරී බලය තිබේද;

(vi) වෛද්‍ය තංගමුත්තු මහතා හට වෛද්‍ය සභාවේ සහතිකය නොමැති බවත්, එතුමා වැඩ බලන උපදේශක වෛද්‍යවරයෙක් පමණක් බවත් එතුමා දන්නේද;

(vii) එසේ නම්, වෛද්‍ය සභාව විසින් සහතික කරන ලද විශේෂඥ උපදේශකවරුන් බොහෝ ගණනක් සිටියදී, එතුමා මෙම තනතුරට පත් කිරීම සාධාරණීකරණය කිරීමට ඇති හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

669/2025

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිලේනියම් සිටි නිවාස සංකීර්ණය ඉදිකිරීම සඳහා ඔරුවල, වානේ සංස්ථාවේ ඉඩම්වලින්, සෙලින්කෝ ඕවලපර්ස් ඇන්ඩ් රියල් ස්ටේට් සමාගම විසින් මිලදී ගෙන සැලසුම අනුමත කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එය ඉදිකිරීමට අදාළ අධිකාරියේ අනුමත සැලසුමක් තිබේ නම්, එය ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) සංකීර්ණයේ පොදු පහසුකම්වලට වෙන් කළ යුතු, සැලසුම අනුව වෙන් කර ඇති සහ භෞතිකව වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) භෞතිකව වෙන් කළ ඉඩම්, අනුමත සැලසුමේ පෙන්වා තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vii) පොදු පහසුකම්වලට සංකීර්ණයෙන් බාහිර වගුරු බිම්වල ඉඩම් වෙන් කර තිබේද;

(viii) එය නීත්‍යානුකූලද;

(ix) නොඑසේ නම්, ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොදු පහසුකම්වලට වෙන් කළ ඉඩම්වලින් අන්සතු කළ ප්‍රමාණය;

(ii) එයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග;

(iii) එම ඉඩම් නැවත ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 මැයි 22 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

11/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම්, විශාල ව්‍යාපෘති සඳහා ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) ‘ඩෝල් ලංකා’ සමාගම හා ‘විටා ඕගනී’ සමාගම වෙත කෙසෙල් වගා කිරීම සඳහා වලව කලාපයේ, චන්ද්‍රිකා වැව කොට්ඨාසයේ ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් නිසි ක්‍රමවේදය අනුව ලබා දී නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

701/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ගුරු විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විද්‍යාලවල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා පහළ මට්ටමක පවතින බැවින්, එම විද්‍යාල, අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ වෙනත් පුහුණු මධ්‍යස්ථාන බවට පත් කිරීමට කටයුතු කරන්නේද;

(iii) ජාතික අධ්‍යාපන ආයතනය උපාධි පිරිනැමීම සඳහා සුදුසුකම්ලත් ආයතනයක් බැවින් ගුරු විද්‍යාලවල එක් අවුරුදු පූර්ණ කාලීන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(iv) නොඑසේ නම්, එම ගුරු විද්‍යාල සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

713/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ සිටින කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ ජාතික තේ අපනයනය සඳහා එම කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කොපමණද;

(iii) කළුතර දිස්ත්‍රික්කයේ ඇති පොහොර සහ කෘෂි උපකරණ ලබා ගත හැකි කුඩා තේ වතු සංවර්ධන සමිති සංඛ්‍යාව කොපමණද;

(iv) කුඩා තේ වතු හිමියන්ගේ සුභසාධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා සාමාජිකයන් බඳවාගනු ලබන ක්‍රමවේදය සහ එම සමිතිවල නිලවරණ පවත්වනු ලබන ක්‍රමවේදය සම්බන්ධයෙන් දැනුම්වත් වී තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ක්‍රමවේද පිළිබඳ විස්තර සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

718/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) 2024/2025 මහ කන්නයේ එම දිස්ත්‍රික්කයේ සමස්ත වී අස්වැන්න කොපමණද;

(iii) වී අස්වැන්න නෙළීමට පෙර මොනරාගල දිස්ත්‍රික්කයේ සියලුම වී ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දී තිබුණේද;

(iv) එම වී අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් මිලට ගන්නා ලද වී ප්‍රමාණය කොපමණද;

(v) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව, එම එක් එක් ගබඩාවේ ලිපිනය හා ගබඩා ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

789/2025

ගරු සුදත් බලගල්ල මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහියංගණය නගරයේ, කෘෂි අලෙවිසලක් ඉදිකිරීමට ලංකා බැංකුවට යාබද ඉඩමේ 2004 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(ii) වර්තමාන ජනාධිපතිවරයා කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස ඉහත ඉඩම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට මූලික කටයුතු කළ බවත්;

(iii) ඒ සඳහා මහියංගණය ගොවිජන සේවා කාරක සභාව සහ ගොවීන් ඉල්ලීම් කළ බවත්;

(iv) ඉහත ඉඩම, මහියංගණය, 48 කණුව, අරාවත්ත පදිංචි වයි.එම්. රත්නපාල මහතාට වරණීය බදු පදනම මත ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 4/10/75144 යටතේ අනුමතිය දී ඇති බවත්;

(v) වරණීය පදනම මත රජයේ ඉඩම් ප්‍රබල සහ විශේෂ හේතු මත පමණක් පවරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් පැවරීමට වයස අවුරුදු 80කට වැඩි පුද්ගලයෙකු තෝරා ගැනීමට හේතුව කවරේද;

(ii) රජයේ ඉඩම් අන්සතු කිරීමේදී, රජයේ අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාණවත් ඉඩම් තිබේද යන්න සහ තෝරා ගන්නා පුද්ගලයාගේ ශාරීරික යෝග්‍යතාවය සලකා බලන බවත්, සාමාන්‍යයෙන් වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයෙකුට රජයේ ඉඩම් ලබා නොදෙන බවත් දන්නේද;

(iii) එම ඉඩම පැවරීමේදී ඉහත කරුණු සැලකිල්ලට ගත්තේද;

(iv) ඉහත බදු අනුමැතිය අවලංගු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

795/2025

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථාන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගැනීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ ක්‍රමවේදය කවරේද;

(iii) පවරා ගන්නා ප්‍රජා ජල සැපයුම් මධ්‍යස්ථානවල ඇති සියලුම දේපළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගන්නේද;

(iv) විධිමත් විගණනයක් සිදු කිරීමකින් තොරව දෙහිඅත්තකණ්ඩිය, නව මැදගම, ප්‍රජා ජල සැපයුම් ඒකකය, මණ්ඩලයට පවරා ගෙන ඇති බව දන්නේද;

(v) එම පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතියක් ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

796/2025

ගරු ඊ. එම්. බස්නායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා, අතු ගංගා, ඔයවල්, ඇළ මාර්ග ආශ්‍රිත වැලි තොටුපළ සංඛ්‍යාව සහ ඒ ආශ්‍රිත රැකියා කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වැලි තොටුපළ අතරින් නීත්‍යානුකූල වැලි තොටුපළ සංඛ්‍යාව කොපමණද;

(iii) නීති විරෝධී වැලි තොටුපළ තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම තොටුපළ සම්බන්ධයෙන් ගනු ලබන නීත්‍යානුකූල පියවර කවරේද;

(v) වැලි කැනීම හේතුවෙන් සිදු වන පරිසර හානිය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කටයුතු සඳහා වාර්ෂිකව අවශ්‍ය වැලි ප්‍රමාණය ගණනය කර තිබේද;

(ii) එම වැලි ප්‍රමාණය සපුරා ගැනීමේ හැකියාවක් තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප ක්‍රම තිබේද;

(iv) නව වැලි සැපයුම් මාර්ග කවරේද;

(v) එම නව වැලි සැපයුම් මාර්ගවලට ප්‍රමුඛතාවය ලබා දෙන්නේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

816/2025

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙයියන්දර නගරය සංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් සැලසුමක් සකස් කර තිබේද;

(ii) එම සැලසුමේ ඇති යෝජනා කොපමණ ප්‍රමාණයක් මේ වනවිට ක්‍රියාත්මක කර තිබේද;

(iii) ඉතිරි යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත සැලසුම අනුව දෙයියන්දර ප්‍රාථමික පාසල මේ වනවිට පවතින ස්ථානයෙන් ඉවත් කිරීමට යෝජනා කර තිබුණේද;

(v) එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරන ලද ආයතනය/පුද්ගලයා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

817/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අයාලේ යන සුනඛ ගහනය පාලනය කිරීම සඳහා 2025 වර්ෂයේදී ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(ii) නිවාසවල ඇති කරන සුනඛයන් හා සුනඛ පැටවුන් මහාමාර්ග හා පොදු ස්ථානවලට ගෙනවිත් දැමීම වැළැක්වීම සඳහා පියවර ගන්නේද;

(iii) අයාලේ යන සුනඛ ගහනය ඉහළ යාම නිසා සිදු වන සුනඛ සපාකෑම් හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

823/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල මේ වනවිට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අනුව සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවකට නේවාසිකාගාර පහසුකම් නොලැබෙන බව පිළිගන්නේද;

(iv) මේ වනවිට කොළඹ විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර සංඛ්‍යාව, ඒවායේ නම් කාන්තා, පිරිමි සහ මිශ්‍ර යන නේවාසිකාගාර වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළඹ විශ්වවිද්‍යාලයේ 800ක් පමණ ශිෂ්‍යාවන් සංඛ්‍යාවකට නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබූ "මුත්තයියා" කාන්තා නේවාසිකාගාරය පිහිටි කොළඹ 02 ප්‍රදේශයේ ඉඩම, 2020 වර්ෂයේදී පවරා ගත් බව දන්නේද;

(ii) එම නේවාසිකාගාරය පිහිටුවා තිබූ ඉඩමේ වර්තමාන හිමිකාරිත්වය සතු ආයතනය කවරේද;

(iii) එම නේවාසිකාගාරය කඩා ඉවත් කර වර්ෂ 05කට අධික කාලයක් ගත වී ඇතත් එහි මේ දක්වා කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, එම සම්පූර්ණ ඉඩම හෝ ඉන් කොටසක් නැවත කොළඹ විශ්වවිද්‍යාලයට ලබා දෙන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 මැයි 23 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

72/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව-බටහිර අධ්‍යාපන කලාපයට අයත් මඩ/කායන්කුඩා කන්නගි විද්‍යාලය සහ කල්කුඩා අධ්‍යාපන කලාපයට අයත් මඩ/කෝරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලය යන පාසල් IC කාණ්ඩයට අයත් පාසල් බවත්;

(ii) මඩ/කායන්කුඩා කන්නගි විද්‍යාලයේ සිසුවියන් එල්ලේ ක්‍රීඩාවෙන් ජාතික මට්ටමින් ප්‍රථම ස්ථානයද, මඩ/කෝරක්කල්ලිමඩු ශ්‍රී රමණ මහරිෂි විද්‍යාලයේ සිසුවියන් කබඩි ක්‍රීඩාවෙන් ජාතික මට්ටමින් ප්‍රථම ස්ථානයද ජයග්‍රහණය කර ඇති බවත්;

(iii) එහෙත් ඉහත පාසල්වලට මේ දක්වා ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් පත්කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත පාසල් සඳහා ශාරීරික අභ්‍යාස උපදේශකවරුන් පත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

94/2024

ගරු වමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළ නිෂ්පාදනය කරන ආහාර භෝගවලට වන සතුන් විසින් සිදු කරනු ලබන හානිය තක්සේරු කර තිබේද;

(ii) එසේ නම්, එම හානිය වී, එළවළු සහ පළතුරු යන එක් එක් භෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආහාර භෝග සඳහා වැඩි වශයෙන් හානි කරනු ලබන වන සතුන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

157/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවට බලපෑ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් විනාශයට පත් වූ මුළු වගා බිම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වගා බිම් ප්‍රමාණය, කුඹුරු, බඩඉරිඟු සහ අනෙකුත් වගා බිම් ආදී ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වගා බිම්වලට සිදු වූ විනාශයේ ඇස්තමේන්තුගත මූල්‍යමය අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විනාශ වූ වගා බිම්වලට ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(ii) එම වන්දි මුදල, කුඹුරු, බඩඉරිඟු සහ අනෙකුත් වගාවන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ දක්වා වන්දි ගෙවා නොමැති වගා බිම් ප්‍රමාණය කොපමණද;

(iv) ඒවාට වන්දි නොගෙවීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

195/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා චීනය විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ නම, ආයෝජනයේ වටිනාකම සහ උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකාවට චීන ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

213/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් තාක්ෂණවේදය විෂයක් ලෙස උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) තාක්ෂණවේදය ඉතා වැදගත් විෂයක් බැවින් එය අනෙකුත් පාසල්වලත් ඉගැන්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

222/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තරුණ ව්‍යවසායකයන්ට ඇප ඉදිරිපත් කිරීමකින් තොරව ණය ලබාගැනීම සඳහා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව පිහිටුවීමට පොරාන්දු වූ සංවර්ධන බැංකුව මේ වනතෙක් පිහිටුවා නොමැති බව දන්නේද;

(ii) එකී මැතිවරණ පොරොන්දුව ඉටු කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

278/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල භාෂාවත්, සිංහල මාධ්‍ය පාසල්වල දෙමළ භාෂාවත් ඉගැන්වීම අනිවාර්ය කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමට නියමිත කාල වකවානු කවරේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ගුරුවරුන් සිටින්නේද;

(iv) නොඑසේ නම්, එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

294/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිරතුරුවම ගංවතුර ගැලීමේ අවදානම සහිත ගංගා සහ ඇළ දොළ කවරේද;

(ii) ඒවායේ ගංවතුර පාලනය කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති දේශීය හා විදේශීය ව්‍යාපෘති කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා භාවිතා කර ඇති දේශීය අරමුදල් ප්‍රමාණය සහ විදේශීය අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ඇති ආයතන කවරේද;

(v) ඉහත ව්‍යාපෘති අතර විවිධ බාධා හේතුවෙන් අසාර්ථක වී ඇති ව්‍යාපෘති තිබේද;

(vi) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

441/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ දහය (10) තුළදී වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ එම මණ්ඩලය ලැබූ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලය තුළ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය විසින් වැය කර ඇති මුදල කොපමණද;

(iv) ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරියේදී වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

618/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු පරිමාණ ගොවීන් සඳහා ''සරුසාර'' නමින් සහන පොළී ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදී තිබේද;

(ii) එසේ නම්, එම ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීමේ අරමුණු කවරේද;

(iii) මේ දක්වා එම ණය යෝජනා ක්‍රමය මඟින් ණය ලබා ගෙන ඇති ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(v) ගොවීන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?